ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## කොළඹ ආරක්ෂක පර්ෂදය

කොළඹ ආරක්ෂක පර්ෂදයේ සාමාජික රටවල් වන ඉන්දියාව, මාලදිවයින, මොරිෂස් සහ ශ්‍රී ලංකාව 2022 ජූලි 7 වන දින කොචි හි ඉන්දියාවේ ජාතික ආරක්ෂක කවුන්සිල ලේකම් කාර්යාලය විසින් පවත්වන ලද හය වන නියෝජ්‍ය ජාතික ආරක්ෂක උපදේශක මට්ටමේ හමුව සාර්ථකව අවසන් කළේය. බංග්ලාදේශ සහ සීෂෙල්ස් නියෝජිතයෝ නිරීක්ෂකයන් ලෙස මේ සඳහා සහභාගී වූහ.

2. ඉන්දීය ජනරජයේ නියෝජ්‍ය ආරක්ෂක උපදේශක ශ්‍රී වික්‍රම් මිස්‍රි, මාලදිවයින් ජනරජයේ විදේශ ලේකම් අහ්මඩ් ලතීෆ්, මොරිෂස් ජනරජයේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ආරක්ෂක කටයුතු පිළිබඳ ප්‍රධාන සම්බන්ධීකාරක යොයිඩිස්තීර් තොකා සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා (WWV, RWP, RSP, VSV, USP, ndc, psc, MPhil) යන මහත්වරුන් විසින් තම රටවල නියෝජිත කණ්ඩායම් හි නායකත්වය උසුළන ලදී. ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ සහ නාවික විදේශ සහයෝගීතාවය පිළිබඳ අධ්‍යක්ෂ සහ කොළඹ ආරක්ෂක පර්ෂද ලේකම් කාර්යාලයේ වැඩබලන ලේකම් කොමදෝරු එම්. එච්. නිශාන්ත පීරිස් (RSP, USP) මහතා විසින් කොළඹ පිහිටි කොළඹ ආරක්ෂක පර්ෂද ලේකම් කාර්යාලය නියෝජනය කරන ලදී. බංග්ලාදේශ නියෝජිත කණ්ඩායමේ නායකත්වය සන්නද්ධ හමුදා කොට්ඨාසයේ ප්‍රධාන ආරක්ෂක නිලධාරී ජෙනරාල් වේකර් උස් සමාන් (SGP, psc) මහතා විසින් ද සීෂෙල්ස් නියෝජිත කණ්ඩායමේ නායකත්වය සීෂෙල්ස් ආරක්ෂක හමුදා මාණ්ඩලික ප්‍රධානී සයිමන් ආර්චන්ගේ ඩයින් මහතා විසින් ද උසුළන ලදී.

3. සාමාජික රටවල් 2022-23 වසර සඳහා සහයෝගීතාවය පිළිබඳ මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහ 2022 මාර්තු 9-10 දිනවල

මාලදිවයිනේ දී පැවති 5 වන කොළඹ ආරක්ෂක පර්ෂදයේ ආරක්ෂක උපදේශක මට්ටමේ රැස්වීමේ දී ගන්නා ලද තීරණ සම්බන්ධයෙන් සාකච්ඡා කළහ. එම තීරණ

- සමුද්‍රීය සුරක්ෂිතතාවය සහ ආරක්ෂාව
- ත්‍රස්තවාදය සහ අන්තවාදය පාලනය
- ජාවාරම් සහ රටවල් අතර සංවිධානාත්මක අපරාධ පාලනය කිරීම
- සයිබර් ආරක්ෂාව, තීරණාත්මක යටිතලපහසුකම් සහ තාක්ෂණය ආරක්ෂා කිරීම
- මානුෂීය ආධාර සහ ආපදා සහන

යන ප්‍රධාන කුළුණු මත පදනම් වී තිබිණ.

*(මෙම පුවත්පත් නිවේදනයේ අන්තර්ගතය රැස්වීමෙන් අනතුරුව නිකුත් කරන ලද ඒකාබද්ධ පුවත්පත් නිවේදනයෙන් උපුටා ගන්නා ලදී)*

*****

කොළඹ
2022 ජූලි 08